12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka
ISSN 2362-0412

# ශ්‍රී ලාංකීය ප්‍රාග්බෞද්ධ ඇදහිලි හා විශ්වාස බුදුසමයේ ව්‍යාප්තියත් සමග යටපත්වීම පිළිබඳ විමර්ශනයක්

ජේ.කේ. ගලප්පත්ති

*සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,රුහුණ විශ්වවිද්‍යාලය*

*Silvashashika4@gmail.com*

**සාරසංක්ෂෙපය**

ලක්දිවට බුදු දහම සම්ප්‍රාප්ත විමට පෙර මෙරට ජනයා අතර පැවති ඇදහිලි හා විශ්වාස යටපත් වූ ආකාරය මූලාශ්‍රය හා සමාජ යේ විවිධ චාරිත්‍ර මගින් දැකිය හැකි ය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ බුදු දහම පැතිරීමත් සමග එකල පැවති අභිචාර ලාංකේය සමාජයෙන් ගිලිහී ගිය ආකාරය හඳුනා ගැනීම යි. වෘක්ෂ වන්දනය, නාග හා යක්ෂ ඇදහීම, පූර දේව වන්දනය, මළවුන් පිදීම, විවිධ වෘත්තීන්ට අදාළ දෙවියන් පිදීම වැනි ප්‍රාථමික විශ්වාස එකල දක්නට විය. මෙකී මිත්‍යා විශ්වාසයන්ට අනුගතව බුදු දහම මෙරට ව්‍යාප්ත වූ ආකාරය අපට දැකිය හැකි ය. මහාවංශය, නාගයින් ලෙස සැලකෙන සත්ත්ව විශේෂයක් ද මිනිසුන්ට අර්ථකාමී ලෙස කටයුතු කරන පිරිසක් වූ දෙවියන් ද අනර්ථකාමී ලෙස කටයුතු කරන පිරිසක් වූ යක්ෂයින් ද සිටි බව මහාවංශයෙහි සඳහන් වෙයි. එකල ප්‍රධාන වශයෙන් ආගමක් නොවුණ ද විවිධ නා නා අභිචාර විධි දක්නට ලැබුණු බවට මහාවංශය වැනි මූලාශ්‍රයන්ගෙන් ගම්‍යමාන වේ. මෙම අධ්‍යයනය සඳහා දත්ත සම්පාදනය කර ගැනීමේ දී ප්‍රධාන වශයෙන් පුස්තකාලය ආශ්‍රය කර ගන්නා අතර එහි දී ප්‍රාථමික මූලාශ හා ද්විතියික මූලාශ පරිහරණය තුළින් තොරතුරු ලබා ගැනුණි. මූලාශ්‍රයන්ගෙන් හා විවිධ ග්‍රන්ථ පරිශීලනයෙන් ලබා ගත් තොරතුරු සංසන්දනාත්මකව විශ්ලේෂණය කර ඉදිරිපත් කෙරේ. මහාවංශය හැර අනෙකුත් මූලාශයන් හා ග්‍රන්ථ ආදියෙහි ප්‍රාග් බෞද්ධ ප්‍රාථමික විශ්වාස පිළිබඳ සඳහන් වේ. පූජාවලිය, රසවාහිනිය, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය ආදී කෘති ඒ සඳහා නිදසුන් වේ. බුදු දහම මෙරට ප්‍රචලිත වීමට පෙර ලාංකේය සමාජයේ පැවති වෘක්ෂ වන්දනය, නාග හා යක්ෂ ඇදහීම, පූර දේව වන්දනය, මළවුන් පිදීම, විවිධ වෘත්තීන්ට අදාළ දෙවියන් පිදීම, බ්‍රාහ්මණ ආගම, පරිබ්‍රාජක ආගම, පර්වත වන්දනය තිබුණු බව සොයා ගැනීමට හැකි වීම. බුදු දහම මෙරටට පැමිණීමත් සමග එකී අභිචාර යටපත් වූ ආකාරය මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වීම මෙහිදී දැකිය හැකි ය. එකල ජනයා සරල දිවිපෙවෙතක් ගෙන ගිය අතර ඔවුහු තමන්ට විෂය නොවන ස්වාභාවික වස්තූන් හා ස්වාභාවික ක්‍රියාකාරකම් දෙස බිය මුසු ආකාල්පයකින් බැලීමට උත්සුක වූහ. එහිදී ඔවුන් එකී වස්තූන් හා ක්‍රියාකාරකම් හමුවේ වන්දනාමාන කිරීමට පෙළඹුණු අයුරු පෙනේ. බුදු සමය පැමිණීමත් සමග ඒ වටා ජනතාව පෙළගැස්වීමක් දැකිය හැකි අතර එවකට පැවති වන්දනාමාන සමාජ තලයෙන් අනුක්‍රමයෙන් යටපත් විය. සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම යති සමාජය ද ඒකී අභිචාර යටපත් කිරීමට උත්සුක වූ ආකාරය ඉතිහාසයෙන් ප්‍රකට වේ. එකී උත්සහයේ ප්‍රතිඵල වූයේ ප්‍රාග් බෞද්ධ ඇදහිලි හා විශ්වාස බුදු සමයේ නැගී ඒමත් සමග යටපත් ව යාම යි.

*ප්‍රමුඛ පද :ඇදහිලි හා විශ්වාස, බුදු සමය, මහාවංශය*